**2023 (2024) අ.පො.ස (සා/පෙළ) ඉලක්ක කරගත් පෙරහුරු පරීක්ෂණ ප්‍රශ්න පත්‍ර**

# කතෝලික ධර්මය

## කට්ටල අංක 02

## පිළිතුරු පත්‍රය

## 11 ශ්‍රේණිය

### I පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 3 | 21. | 3 | 31. | 4 |
| 02. | 1 | 12. | 2 | 22. | 2 | 32. | 4 |
| 03. | 3 | 13. | 4 | 23. | 2 | 33. | 1 |
| 04. | 4 | 14. | 2 | 24. | 1 | 34. | 1 |
| 05. | 2 | 15. | 3 | 25. | 2 | 35. | 3 |
| 06. | 3 | 16. | 4 | 26. | 3 | 36. | 3 |
| 07. | 3 | 17. | 1 | 27. | 4 | 37. | 2 |
| 08. | 1 | 18. | 2 | 28. | 1 | 38. | 1 |
| 09. | 4 | 19. | 3 | 29. | 3 | 39. | 3 |
| 10. | 1 | 20. | 3 | 30. | 3 | 40. | 4 |

(ලකුණු 1 ×40 = 40)

### II පත්‍රය

01. i. රූත් කථාව හා එස්තර්

ii. ග්‍රීක පිටපත - සෙප්ටුවාජින්ත පිටපත

හීබෲ පිටපත - මැසරොටික් පිටපත

iii. කතෝලිකයින්ට එරෙහිව පනවා තිබූ සියලු නීති අවලංගු කිරීම / කැමති ආගමක් ඇදහීමේ නිදහස ලැබීම .

iv. කිතුනු ජීවිතයේ පරමාර්ථය / කිතුනු ජීවිතය ගත කළ යුතු ආකාරය

v. පූප කැඩීම / ස්වාමීන් වහන්සේගේ රාත්‍රී භෝජනය / නව පාස්කු මංගල්‍යය / ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරයේ සහභාගීකම

vi. පෙර - දේවකාරිය පසු - යාමයන්හි ජනවන්දනාව

vii. දෙවියන් වහන්සේව විශ්වාස කිරීම .

නපුරා (සාතන්) සහ උගේ ක්‍රියා ප්‍රතික්ෂේප කිරීම.

viii. අළු බදාදා , මහ බ්‍රහස්පතින්දා

ix. දෙවියන් වහන්සේගේ මධ්‍යස්ථකයාණෝ ( XII පියුස් සුදකුම් පිය)

දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ ජනවන්දනාව පිළිබඳ ව්‍යවස්ථාව

x. පෙරදිග කතෝලික සභා පිළිබඳ නියෝගය / කිතුනු සභා ඒකත්වය නගාලිමේ නියෝගය

(ලකුණු 2 × 10 = 20)

02. i. සාර්ථකව , ධර්මිෂ්ඨව (ල : 02)

ii. උඳුරන්නට / කඩා දමන්නට / හෙළා දකින්නට / සිටුවන්නට (ල : 03)

iii. **අන් අය විසින් ප්‍රතික්ෂේප කිරීම.**

දිවැසිවර ආදර්ශය සිහියට නංවා ගැනීම / දිවැසිවර ජීවිත කතා කියවීමෙන් ධෛර්යය ලැබීම / තමාව ප්‍රතික්ෂේප කරන අය කෙරෙහි මෙත් සිත් වැඩීම / දේව ශක්තිය ඉල්ලා යැදීම.

**නූතන තාක්ෂණය**

නූතන තාක්ෂණය තුළින් නිවැරදි නව මං පෙත් සොයා යමින් දිවැසිවර කාර්යය සඳහා එය යොදා ගැනීම.

**තරුණ පිරිස් දුම්වැටි හා මත් ද්‍රව්‍යවලට යොමු වී සිටීම.**

දුම්වැටි , මත්ද්‍රව්‍යයන්හි ආදීනව කියා දීම / එයින් මුදා ගැනීමට උපදෙස් දීම / එවැනි තරුණයින්ව ආගම දහමට යොමු කිරීම / අවශ්‍ය උපදේශනයන් කරා යොමු කිරීම.

**මිනිස් ජීවිත කාර්ය බහුලත්වය තුළ සිරවී සිටීම.**

කාර්ය බහුලත්වය මුදල් සොයා යෑමට පමණක් යොමු වීමේ ආදීනව පෙන්වා දීම. දිව්‍ය පූජාවට සහභාගී වීම තුළ , යාච්ඤාව සඳහා කාලය යෙදවීම තුළ දැනෙන ආත්මික සුවසහනය අත්දකින්නට සැලැස්වීම.

**වර්තමාන සමාජය සාම මාවතක් කරා යාමට ඇති උනන්දුවේ අඩුකම**

වෛරය තුළින් කවදාකවත් සැනසීමක් නොලැබෙන බව කියා දීම / ප්‍රචණ්ඩ ක්‍රියා ප්‍රතික්ෂේප කිරීම / යුධ ආකල්ප මිනිස් ඝාතන යනාදිය නොකිරීමට මඟ පෙන්වීම / මිනිස් අයිතිවාසිකම් සුරැකීම / දුබලයන් ආරක්ෂා කිරීම ...... යනාදී පිළිතුරු (ල : 05)

03. i. ශුද්ධ වූ අම්බ්‍රෝස්තුමා

ii. කිරිඳි / අබ ඇටය / මුහුන් / වපුරන්නා / නිධානය / මුතු ඇටය සහ දැල පිළිබඳ උපමාව

iii. දැත් එක්කර ''ජේසු පිහිටයි '' කීම. / නිවසින් බැහැර වීමට පෙර කුරුසියේ ලකුණු ඇඳීම. / දෙමාපියන්ට , ගුරුවරුන්ට වැඳීම / වැඩිහිටියන්ට ඉහළින් වාඩි නොවීම. / වැඩිහිටියෙක් පැමිණෙන විට අසුනෙන් නැගිටීම.

04. i. රෝසමල් උයන / රෝසමල් දම

ii.

| | | |
|---|---|---|
| ෆාතිමා නුවර දර්ශනය වීම | - | ලුසී , ජසින්තා , ෆ්‍රැන්සිස්කෝට |
| ලූර්දු නුවර දර්ශනය වීම | - | බර්ණදෙත් දැරියට |
| වේලක්කන්නී නුවර දර්ශනය වීම | - | කිරි වෙළඳාමේ යන පිරිමි දරුවෙකුට |

iii. ජේසුස් වහන්සේ කුරුස ගසේ දී සිය මෑණියන් වන මරිය තුමිය තමන් වහන්සේට ප්‍රේම කළ ශ්‍රාවකයාට මෑණියන් කොට භාර දුන් සේක (ජොහන් 19:25.27)

- ජේසුස් වහන්සේගේ ස්වර්ගාරෝහණය දක්වා ම අපොස්තුලුවරුන් හා ජනතාව සමඟ සිටි මරිය තුමිය එයින් පසු ව ඔවුන් ව අත්නොහැර සැම දෙනා සමඟ එක්සිත් ව නොකඩවා යාච්ඤාවේ නිරත වුවා ය. (ක්‍රියා 1 : 14)
- ක.ස.ධ 963 ට අනුව මරියතුමී ජේසුස් වහන්සේගේ මාතාව ද ශුද්ධ වූ සභාවේ මාතාව ද වන බව පැහැදිලිය.
- Vi වන පාවුලු ශුද්ධෝත්තම පියතුමාගේ ''මිස්ටෙරියුම් ෆිඩෙයි'' හෙවත් විශ්වාසයේ අභිරහස නැමැති විශ්ව ලේඛනයට අනුව ද එතුමිය ලෝකයේ විවිධ ස්ථානවල දර්ශනය වෙමින් කළ ප්‍රකාශ හා එදිනෙදා ජීවිතයේ අප අත්දකින මැදිහත් පිහිට තුළින් ද මරිය තුමිය ශුද්ධ වූ සභාවේ මාතාවන් බව ස්ථිර ව ම තහවුරු වේ. විවිධ ස්ථානවලදී දර්ශනය වෙමින් , මැදිහත් වෙමින් , ශුද්ධ වූ සභානේ මාතාව ලෙස අද මරියතුමිය අදෘෂ්‍යමානව අප සමඟ වැඩ සිටින්නිය.

05. i. නික්මයාම , ද්වීතීය නීති සංග්‍රහය

ii. වසරේ සෑම ඉරු දිනයක්ම /ජන 01 - පරිශුද්ධ දේව මාතා මංගල්‍යය / අගෝස්තු 15 දේව මාතාවන් පරලොවට වැඩිය මංගල්‍යය / දෙසැම්බර් 25 නත්තල් මංගල්‍යය

iii. පාලකයින්ට ගරු කිරීම හා අවනත වීම ( දේව පනත් උල්ලංඝනය වන අවස්ථාවලදී පාලකයින්ට අවනත වීම අවශ්‍ය නැත.) / තම හෘදය සාක්ෂියට අනුව ඡන්දය භාවිත කිරීම / නියමිත ලෙස බදු ගෙවීම / රාජ්‍ය සම්පත් පොදු දේපළ පෞද්ගලික පරිහරණයට යොදා ගැනීම / තම වැටුපට වහල් නොවී සේවය අවංකව ඉටු කිරීම.

06. i. ගොබ් ඉරුදින / මහ බ්‍රහස්පතින්දා දිනය / මහ සිකුරාදා දිනය / ආලේලූයියා සෙනසුරාදා දිනය

ii. දෙසැම්බර් 25 - ( නත්තල) ක්‍රිස්තෝත්පත්ති මංගල්‍යය / දෙසැම්බර් 25 වන දිනට පසුව එන ඉරිදා (ශුද්ධ වූ පවුලේ මංගල්‍යය) / ජනවාරි 01 - පරිශුද්ධ දේව මාතාවන්ගේ මංගල්‍යය / ජනවාරි 02 - 08 අතර ඉරිදා - දිව්‍ය බිළිඳාණන් රජුන්ට ප්‍රත්‍යක්ෂ වීමේ මංගල්‍යය, ජේසුස් වහන්සේගේ ප්‍රසාද ස්නාපන මංගල්‍යය

iii. සම්පූර්ණ දිව්‍ය පූජාවට නිසි සූදානමකින් යුතුව අර්ථාන්විතව භක්තියෙන් සහභාගී වීම. / ශාරිරික හා ආත්මික සූදානමකින් යුතුව දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීම / සතියේ වෙනත් දිනවලට වඩා යාච්ඤා කිරීම හා ඒ අනුව ජීවත් වීම / ශුද්ධ ලියවිල්ල කියවා මෙනෙහි කිරීම /දයාවේ ක්‍රියාවල නිරත වීම.

07. i. භාග්‍යවත් තෙරේසා මව්තුමියගේ දූත සේවාව

- ශුද්ධෝත්තම පියතුමාගෙන් විශේෂ අවසරයක් ලැබ 1948.08.17 වන දින ''දයාවේ දූතිකාවෝ '' නමැති පැවිදි නිකාය ආරම්භ කළ ශුද්ධ වූ තෙරේසා මවුතුමිය කල්කටා නගරය තුළ කිසිවකුගේ පිහිටක් නොලත් රෝගී , දුගී , අසරණ හා අනාථ ළමුන්ට සේවය කළාය.

- මරණාසන්නව පාර දෙපස වැටී සිටි අයට , කෙනෙකුගේ රැකවරණය හා උපස්ථාපනය ඇති ව මිනිසෙකු ලෙස මරණයට පත්වීම ට අවස්ථාව ලබා දුන්නා ය.
- එතුමිය ප්‍රාදේශීය නායකයන්ගෙන් ඉල්ලා සිටියේ , ''මට ගෙයක් දෙන්න , මැරෙන්න වැටී සිටින අයව මං බලා ගන්නම් '' කියාය.
- වීදි ජනයා බැහැ දැකීමට යාමට ඇය පුරුදු වූවා ය.
- ජාති ,ආගම් , කුල භේද නොතකා අසරණ දරුවන් , අනාථයන් , රෝගීන් හා මරණාසන්න වූවන්නට එතුමියගේ සෙවන තුළ ආදරය නොඅඩුව ලැබිණි.
- තමා සන්තකව තිබූ රුපියල් පහක මුදලින් ආරම්භ කළ මෙම සමාජ සත්කාරයට ලැබුණු මහත් දේව ආශිර්වාදය නිසා එය ප්‍රබල ලෙස වර්ධනය විය.
- ඒඩ්ස් රෝගීන් රැකබලා ගැනීම සඳහා නිව්යෝර්ක් නගරයේ නගරාධිපතිව හමු වූ එතුමිය නිවසක් ඉල්ලා සිටියාය. එම ඉල්ලීම අනුව ලැබුණු නිවසෙහි ඒඩ්ස් රෝගීන් රැකබලා ගැනීමට කන්‍යා සොයුරියන්ව පත් කළා ය.
- ආදරය අහිමි අයට ආදරය රැකවරණය ලබා දීම මුඛ්‍ය පරමාර්ථය විය.
- එතුමියගේ සේවාවන් අතර මරණාසන්න රෝගීන් හා ඒඩ්ස් රෝගීන් සඳහා නිවාස පවත්වා ගෙන යාම ප්‍රධාන විය.
- මෙතුමියගේ මෙම දයා සේවාවන් නිසා ''අසරණ සරණ දූතිකාව '' හා ''ජීවමාන සාන්තුවරිය'' යන විරුදාවලි ලැබුවා ය.

ii. නව ගිවිසුමේ පාස්කු භෝජනය

- ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ විසින් මහ බ්‍රහස්පතින්දා දින සිදු කරන ලදී.
- එදින දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපනය කරන ලදී.
- පූපය රැගෙන එය උන්වහන්සේගේ ශ්‍රී ශරීරය බවට පත් කළ සේක.
- මිදි යුෂ රැගෙන එය උන්වහන්සේගේ ශ්‍රී රුධිරය බවට පත් කළ සේක.
- උන් වහන්සේ සිහිවීම පිණිස මෙය සිදු කරන ලෙස ඉල්ලා සිටින සේක.
- දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ මගින් උන්වහන්සේ සදහට අප සමඟ වැඩ සිටින සේක.
- මෙමගින් පුරාණ ගිවිසුමේ පාස්කු බැටළුවාගේ තැන උන්වහන්සේ ගත් සේක.
- පසු දින තම ජීවිත යාගය මගින් නව ගිවිසුමේ බැටළුපෝතකයාණෝ වූ සේක.
- ප්‍රේමයේ පනත ස්ථාපිත කිරීම ( පාද සේදීම)

iii. සිය දිවි නසා ගැනීම

සිය දිවි නසා ගැනීම තමාටත් , අසල්වැසියාටත් , දෙවියන් වහන්සේටත් විරුද්ධ ව කරන පාපයකි. එය අසල්වැසියන්ට විරුද්ධ ව පාපයක් වන්නේ , අසල්වැසියා සමඟ අප මෙතෙක් පැවැත් වූ සබඳතා ,අප ම හිතුවක්කාරී ලෙස අවසන් කරන නිසා ය.

ජීවිතය ගැන දෙවියන් වහන්සේ ඉදිරියේ වගකීම සෑම පුද්ගලයකුට ම ඇත. ජීවිතයේ අධිපතියාණෝ මහෝත්තම වූ දෙවියන් වහන්සේ ය. ජීවිතය ස්තුති පූර්වක ව පිළිගෙන දෙවියන් වහන්සේගේ මහිමය හා අපගේ ආත්ම ගැළවීම සඳහා ද ආරක්ෂා කිරීම අපට පැවරී ඇති ණය යුතුකමකි. දෙවියන් වහන්සේ අපට පවරා ඇති ජීවිතයේ හිමිකරු ද දෙවියන් වහන්සේ මිස අපි නොවෙමු. සිය දිවි නසා ගැනීම දෙවියන් වහන්සේට දිය යුතු ප්‍රේමයට විරුද්ධ වීමකි.

(කතෝලික සභා ධර්මෝපදේශය 2250 - 2281)

iv. දේශක දිවැසිවරු

දේශක දිවැසිවරුන් නමින් පුරාණ ගිවිසුමෙහි පොත් නොමැති අතර ඔවුන්ගේ වචන හා ක්‍රියා 1 - 2 සාමුවෙල් හා 1 - 2 රාජාවලි ග්‍රන්ථවල දක්නට ඇත. එවැනි දිවැසිවරු කිහිප දෙනෙක් නම් 1 . නාතාන් 2. එලියා 3. එලිෂා 4. හුල්දා 5. අහියා 6. මීකායා

දේශක දිවැසිවරුන්ගේ ලක්ෂණ තුනකි.

1. ධ්‍යානයට සමවැදීම (1 සමුවෙල් 10 : 5 - 15)
2. කණ්ඩායම් වශයෙන් මෙහෙවරෙහි යෙදීම (1 සමුවෙල් 19 : 18 - 24)
3. තම දූත මෙහෙවර සනාථ කිරීම සඳහා හාස්කම් කිරීම (1 රාජාවලිය 17 : 16 - 24)